**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2022**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර පිරිවැය රු.202,029,783 ක්වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ආයතනයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගෙන ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.25,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන හා රු.1,327,215 ක පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව 2023 වර්ෂයේ ගිණුම්කරණ වාර්තා පිළියෙල කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විට ආයතනය විසින් පේටන්ට් බලපත්‍ර 14 ක් ලබාගෙන තිබුණු නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 ට අනුව එම පේටන්ට් බලපත්‍රවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනයේ පේටන්ට් බලපත්‍ර වටිනාකම් ගිණුම්ගත කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුළදී වසර 30 ක කාලයක් සඳහා රු.22,440,000 ක වටිනාකමකට බදු පදනම මත ලබා ගන්නා ලද හන්තාන පතන වත්තේ වාර්ෂික බදු වටිනාකමේ වර්තමාන අගය ගණනය කර වත්කම් හා වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ ගිවිසුමෙහි තොරතුරු දැන ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2022 අවසන් ගිණුම්වල ඇතුළත් කිරීමට නොහැකි වූ බව හා ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | බදු ඉඩමේ වර්තමාන අගය ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයකදී රු.233,190,000 කට තක්සේරු කර තිබුණු ඉඩම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමේදී එදිනට වූ රු.42,104,173 ක ඉඩම් වටිනාකම ප්‍රත්‍යාගණන ගිණුමට මාරු නොකිරීම හේතුවෙන් ඉඩම් වටිනාකම හා ප්‍රත්‍යාගණන සංචිතය රු.42,104,173 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ප්‍රත්‍යාගණිත දිනට ඉඩම්වල අගය ගිණුමෙන් ඉවත් නොකිරීම හේතුවෙන් වූ රු.42,104,173 ක ඉඩම්වල හා ප්‍රත්‍යාගණන සංචිතයේ අධිගණනය වීම 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම් ප්‍රත්‍යාගණනයේදී පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ වත්කම් ඒකක 50 ක් වෙන්දේසි කිරීම වෙනුවෙන් රු.1,441,300 ක ආදායමක් ලැබී තිබුණු නමුත් එහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ගණනය කර ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගණනය කර ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 82,377,491 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.102,650,637 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,273,146 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන වැඩි වීම හා ක්ෂය වීම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පේටන්ට් බලපත්‍රය අලෙවි කිරීමෙන් පසු ආයතනය විසින් ඒ සඳහා වියදම් දැරිය යුතු බවට ගිවිසුමේ කිසිදු බැඳීමක් නොතිබියදී 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය | 2014 වර්ෂයෙන් පසු මුදල් වැය කර ඇත්තේ මෙම ව්‍යාපෘතියේ සොයා ගැනීම් අනෙකුත් බෝග සඳහා භාවිතයට ගත හැකි ආකාරය | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අවසාන දිනය දක්වා කාලය තුළ Biofilm Bio Fertilizer ව්‍යාපෘතියේ පර්යේෂණ කටයුතු වෙනුවෙන් රු.138,931,059 ක මුදලක් වැය කර තිබුණි. එසේ වුවද එම පේටන්ට් බලපත්‍රය අලෙවි කළ සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන මගින් ආදායමේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමකින් තොරව 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.7,380,146 ක් Royalty Payment වශයෙන් ලබාගෙන තිබුණි. | නිරීක්ෂණය කිරීමටත් යූරියා පොහොර භාවිතය සම්පූර්ණයෙන් නතර කොට කොම්පෝස්ට් පොහොර පමණක් වී වගාව සඳහා භාවිතා කිරීමට ඇති හැකියාව නිරීක්ෂණය කිරීම සඳහා බව. | |
| (ආ) නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව ක්‍රියාත්මක කර තිබුණු ඒකාබද්ධ මෘදුකාංග පද්ධතිය (integrated software) අතරමඟ නතර කිරීමට කළමනාකරණ මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.660,000 ක අත්තිකාරම් මුදල ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකී මෘදුකාංගයේ භාවිතයට ගත හැකි කොටස් 2023 වසරේ ජනවාරි මාසයේ සිට භාවිතා කරමින් පද්ධතිය වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කරන බව. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට රු.6,500,000 ක් වැය කර ක්‍රියාත්මක වෙමින් තිබුණු Waste water Treatment at Service Station පර්යේෂණ ව්‍යාපෘතිය හා පසුගිය වසර 03 ක කාලය තුළ ක්‍රියාත්මක කරන ලද වටිනාකම සොයාගත නොහැකි වූ පර්යේෂණ ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ක්‍රියාත්මක නොකර අතරමඟ නවතා දමා තිබුණි. | පර්යේෂණයේ ඉදිරි කටයුතු සඳහා ප්‍රතිපාදන හා පර්යේෂණ සහකරුවන් නොමැති වීම හේතුවෙන් ඉදිරියට කරගෙනයාමට නොහැකි වී ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි වන අයුරින් පර්යේෂණ කටයුතු අවසන් කළ යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජන**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ ප්‍රදාන 09 කට අදාළ රු.3,251,129 ක් වසරකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | මෙම අරමුදල් 2023 වර්ෂයේදී ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කරනු ලබන බව. | අරමුදල් අදාළ කාර්යයන් සඳහා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ආයතනය ආරම්භයේ සිට මේ දක්වා පර්යේෂණ ව්‍යාපෘති 14 කට අදාළව ලැබී තිබුණු පේටන්ට් බලපත්‍ර 14 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනය වන විටත් අලෙවි කිරීමට හෝ වෙනත් ආකාරයකින් උපයෝජනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ලබාගෙන ඇති පේටන්ට් බලපත්‍ර අලෙවි කිරීමට හෝ වාණිජකරණය කිරීමට අදාළව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව. | පේටන්ට් බලපත්‍ර ප්‍රශස්ත අයුරින් උපයෝජනය කළ යුතුය. |